# කෘෂි නිෂ්පාදනයෙන් කර්මාන්තවලට

ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රය පුළුල් ලෙස බලන කළ වාණිජ කෘෂිකර්ම ක්ෂේත්‍රය සහ පාරිභෝගික කෘෂිකර්ම ක්ෂේත්‍රය වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. කෘෂිකාර්මික භෝග වල නිෂ්පාදන, වාණිජ හා පාරිභෝගික ලක්ෂණ අනුව මෙම වෙනස හඳුනා ගත හැකිය. තේ, පොල්, රබර් මුල් කොට ගත් වාණිජ කෘෂි ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ අර්ථ ක්‍රමය තුළ ඉතා පුළුල්ව පැතිරී ගොස් ඇති අතර ආදයම ඉපයීම අතින් මෙම අංශය අර්ථ ක්‍රමයේ ඉතා වැදගත් තැනක් ලබා ගෙන ඇත. විදේශීය ආධිපත්‍යය නිසා ශ්‍රී ලංකාවට උරුම වූ මෙම වාණිජ ආර්ථික ක්ෂේත්‍රය මෑතක් වන තුරුම ශ්‍රී ලංකාවේ අපනයන ඉපයුම් අංශය තුළ ඉතාම වැදගත් අංශය විය.

යටත් විජිත පාලනයේ අරමුණු අනුව අපනයන භෝග නිෂ්පාදන අංශය ප්‍රබල ලෙස තහවුරු වීමෙන් වාණිජ අර්ථ රටාවක් ගොඩ නැගීම නිසා එතෙක් මෙරටේ පැවැති දේශීය අර්ථ රටාව විනාශ විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථිකය තුළ නව වෙනස් වීම් නිසා ජනතාව වාණිජ අර්ථ රටාවකට හුරු පුරුදු වූහ. එහෙත් එම රටාව නිසා ජනතාවගේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා විදේශ මත යැපෙන්නට සිදු වීමත්, මෙරට ස්වාභාවික හා ශ්‍රම සම්පත් වලින් වැඩි ප්‍රයෝජනයක් ගැනීම සඳහාත් දේශීය පාරිභෝගික කෘෂි ක්ෂේත්‍රය වර්ධනය කිරීමේ අවශ්‍යතා පැන නැංගේය. වැඩි වන ජන ගහන ප්‍රශ්නය විසඳීමත්, ආහාර සඳහා එතෙර යන විශාල මුදල රැක ගැනීමත් සඳහා දේශීය පාරිභෝජන කෘෂි ක්ෂේත්‍රය වර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ අංගයක්ද විය.

විශේෂයෙන් නිදහස ලැබීමට ආසන්න කාලයේ සිට විවිධ සංවර්ධන සැලසුම් මෙන්ම විශාල හා සුළු මාර්ග යෝජනා ක්‍රම මගින් ද වියළි කලාපය තුළ, වී වගාවද අතිරේක ආහාර භෝග නිෂ්පාදනය ද පුළුල් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ කරන ලදී. විශේෂයෙන් විශාල වාරි මාර්ග යෝජනා ක්‍රම යටතේ වියළි කලාපයේ වාරි මාර්ග පිළිසකර කිරීමත් නව වාරි මාර්ග ඉදි කිරීමත් සිදු වූ අතර මෙම යෝජනා ක්‍රම වල

කෘෂි කර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ

**ඩබ්. ඩී. ධර්මසේන**

**විසිනි.**

ජන පදිකයන් පදිංචි කර ඔවුන්ට ඉඩම් බෙද දීම මගින් ආහාර භෝග නිෂ්පාදනය විශාල ලෙස ව්‍යාප්ත කරන ලදී.

මේ බව වගු 1 මගින් පැහැදිලි වේ.

මෙම දශකය තුළ මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් නව වගා බිම් ව්‍යාප්ත වීම නිසා ශ්‍රී ලංකාවේ පාරිභෝගික කෘෂි කර්මය තුළ නව පෙරලියක් සිදු වීමේ ලකුණු පහල වෙමින් පවතී. මුල් කාල පරිච්ඡේදය තුළ කෘෂි කර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ මූලික භාර්ය භාරය වූයේ ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන වී අතිරේක ආහාර භෝග එලවළු සහ පළතුරු වැනි භෝග නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීම වුවද මෑත කාලයේ ඇති වූ කෘෂි ක්ෂේත්‍රයේ නව සංවර්ධනය නිසා මීට වඩා පුළුල් ලෙස සිතීමට අවස්ථාව එළඹී ඇත.

විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් නිසා වී වගා කරණ බිම් ප්‍රමාණය වාර්ෂිකව වැඩි වීමත් විවිධ පර්යේෂණ නිසා වැඩි අස්වනු සහිත කෙටි කාලීන වී වර්ග සොයා ගැනීමත් නිසා වර්ෂයකට කන්න දෙක සහ තුන බැගින් වගා කිරීමට ඉඩකඩ ලැබීමත් — විශේෂයෙන් මහ වැලිය ඇතුලු අනෙකුත් මහා මාර්ග වාරි යටතේ මනා ලෙස වාරි කළමණාකරන කටයුතු ක්‍රියාත්මක වීමත් — හේතු කොට ගෙන විශාල වශයෙන් වී නිෂ්පාදනය වාර්ෂිකව වැඩි වෙමින් පවතී. මෙයට අමතරව පොහොර භාවිතය සහ නවීන කෘෂි රසායනික භාවිතය නිසා නිෂ්පාදන ඉලක්ක කරා ලඟා වෙමින් පවතී.

මෙහි ප්‍රතිඵලය වනුයේ වී නිෂ්පාදනයේ අතිරික්තයක් අනාගතයේ ඇති වීමයි. එවැනි තත්ත්වයක් ඇති වුවහොත් ආහාර භෝග නිෂ්පාදන අංශය තුළ ප්‍රශ්ණ සහගත තත්ත්වයක් ඇති නොවී වැඩි වන නිෂ්පාදන අලෙවි කර ගැනීමට කටයුතු සැලසීම සඳහා ප්‍රධාන මාධ්‍ය ලෙස කෘෂි ආශ්‍රිත කර්මාන්ත රටාවක් බිහි කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අදළ ආයතනයන්ට කරුණු පැහැදිලි කර ඇත.

ආහාර භෝග නිෂ්පාදනය දේශීය අවශ්‍යතාවයට වඩා වැඩි වුවහොත් වෙළඳ පොළේ මිළ පහළ වැටීමෙන් ගොවියාට වන පාඩුව නැති කිරීම සඳහා මාර්ග දෙකක් තෝරා ගෙන ඇත.

**වී නිෂ්පාදන ක්‍රියාකාරිත්වය** **වගු අංක 1**

| | වර්ෂය | වගාව අක්කර දශලක්ෂ | අක්කරයකට අස්වැන්න (බුසල්) | නිෂ්පාදනය (බුසල් දශලක්ෂ) |
|---|---|---|---|---|
| මහ | 1983/84 | 1.50 | 58.79 | 65.15 |
| යල | 1984 | 0.95 | 61.02 | 50.81 |
| මහ | 1984/85 | 1.41 | 67.84 | 83.93 |
| යල | 1985 | 0.77 | 64.83 | 43.63 |
| මහ | 1985/86 | 1.37 | 69.54 | 80.82 |
| යල | 1986 | 0.84 | 63.76 | 43.13 |
| මහ | 1986/87 | 1.25 | 71.33 | 66.74 |
| යල | 1987 | 0.67 | 62.13 | 34.29 |
| මහ | 1987/88 | 1.36 | 71.00 | 81.87 |

(1) ආනයන

(2) දේශීය පාරිභෝජනය වැඩි කිරීමට අමතරව ඉතිරි නිෂ්පාදනය උපයෝගී කර ගත හැකි කෘෂි කර්මය ආශ්‍රිත කර්මාන්ත රටාවක් බිහි කිරීම.

මීට අමතරව විශේෂයෙන් සෝයා බෝංචි නිෂ්පාදනය සහ පෝෂණය සඳහා අවශ්‍ය කරණ අතිරේක ආහාර භෝග නිෂ්පාදනය දියුණු කිරීමත් එම ද්‍රව්‍ය විවිධ කාර්මික නිෂ්පාදනයන්ට හැරවීම සඳහා දැඩි අවධානය යොමු වී ඇති අතර මේ මගින් තමන්ගේ පෝෂණ අවශ්‍යතාවන් මග හරවා ගැනීමට මෙන්ම නිර්යාත කටයුතු දියුණු කිරීමෙන් අපනයන ආදායම් ඉපයීම් වර්ධනය කිරීමටත් බලාපොරොත්තු වේ.

සංවර්ධනය වන රටවල මෑත දශක කිහිපය තුළ මූලික ද්‍රව්‍ය නිෂ්පාදන මිළ ගණන් ලෝක වෙළඳ පලේ පහළ යාමේ තර්ජනය නිසා නියමිත ඉපැයුම් වැඩි කර ගැනීම බරපතල ප්‍රශ්නයක් වී තිබේ. නියමිත මිළ ගණන් පහළ යාමත්, ආනයනයන්හි ගණන් ඉහළ යාමත් නිසා අවාසි දයක වෙළඳ අනුපාතයක් සංවර්ධනය වන රට වලට උරුම වී ඇත. මේ අවදනම් අන්තර් ජාතික වෙළඳ රටාවෙන් බේරීමට නම් හැකි පමණ අමු ද්‍රව්‍ය හෝ ප්‍රාථමික ද්‍රව්‍යය නිර්යාතයට අමතරව ද්විතියක හෝ නම්. නිෂ්පාදන භාණ්ඩ නිර්යාත භාණ්ඩ පරිමාවට එක් කිරීමේ අවශ්‍යතාව මෙම අමාත්‍යාංශය විසින් අවබෝධ කර ගෙන ඇත. මේ සඳහා හැකි පමණ කෘෂි කාර්මික නිෂ්පාදන වලින් නව නිපයුම් වෙළඳ පලට යැවීමට දැඩි අවධානයක් යොමු කරනු ලැබේ. මේ සඳහා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද හොඳ ඉල්ලුමක් ඇති බව දේශීය වෙළඳ පොලෙන් මෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ද කෙරෙන ඉල්ලුම් තොග පරික්ෂා කිරීමෙන් පැහැදිලි වෙයි.

වී අලෙවි මණ්ඩලය විසින් සහල්, පිටි, සෝයා පිටි සහ විවිධ නිෂ්පාදනයන් වෙළඳ පලට යැවීම දැනටමත් පර්යේෂණ පවත්වා ඇත. සෝයා පර්යේෂණ ආයතනය, සෝයා කිරි, ඇතුළු විවිධ සෝයා නිෂ්පාදන වෙළඳ පලට ඉදිරිපත් කිරීම සඳහා පර්යේෂණ පවත්වනු ලැබේ. මේ සඳහා අවශ්‍ය නව තාක්ෂණික උපකරණ ලබා දීමෙන් හා අවශ්‍ය ප්‍රතිපත්ති හා පර්යේෂණ සඳහා ඒ ඒ අංශ යොමු කිරීමෙන් ද අමාත්‍යාංශය විසින් දිවයිනේ කෘෂි කාර්මික කර්මාන්ත රාමුවක් බිහි කිරීමට අවශ්‍ය මූලික පදනම මේ වන විට සකස් කර ඇත.

මෙම අමාත්‍යාංශය යටතේ සංවිධානය කර ඇති සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව මගින් මෑත කාලයේදී කරන ලද සංවර්ධන කටයුතු නිසා සුළු අපනයන භෝග නිෂ්පාදන ක්ෂේත්‍රය මෙන්ම නිෂ්පාදන විවිධ උසස් තාක්ෂණික, උපකරණ මගින් ලෝක වෙළඳ පලට අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම සහ ඒවායෙන් විවිධ කාර්මික සහ අතුරු නිෂ්පාදන කිරීම ඉහළ තත්ත්වයකට නංවා ඇත. සුළු අපනයන නිෂ්පාදකයන්ට මෙන්ම මෙම ද්‍රව්‍ය වලින් කාර්මික නිෂ්පාදනයන් කරන්නන්ටද විවිධ මූල්‍ය සහ තාක්ෂණික ආධාර දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ. කුරුඳු තෙල්, පැඟිරි තෙල්, කොකෝවා, කරාබු තෙල් ආදී විවිධ නිෂ්පාදන මෙන්ම මෙම ද්‍රව්‍ය විවිධ අයුරින් ලෝක වෙළඳ පලට සකස් කිරීම සඳහා අවශ්‍ය කාර්මික හා විද්‍යාත්මක තාක්ෂණික දැනුම ලබා දීම සඳහා අමාත්‍යාංශය මගින් විවිධ ප්‍රතිපත්ති සම්පාදනය කර තිබේ. මෙම කාර්මිකරණ වැඩ පිළිවෙලේ ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය දශකය තුළ සුළු අපනයන භෝග අපනයනයේන් ලද ඉපැයුම් විශාල ලෙස ඉහළ ගොස් ඇත. මාතලේ කොකෝවා සකස් කිරීමේ කාර්මික සංකීර්ණය මගින් මේ ද්‍රව්‍ය නිෂ්පාදකයින්ට සහ වෙළඳුන්ට උසස් මට්ටමේ නිෂ්පාදනයන් බිහි කරන ආකාරය පිළිබඳ අවශ්‍ය කාර්මික ඥානය ලබා දීමට කටයුතු කරනු ඇත.

ලෝක ආහාර සංවිධානය හා එක්සත් ජනපදයේ අන්තර්ජාතික සංවර්ධන ආධාර සපයන ආයතනය සමග ඇති කර ගෙන ඇති සම්බන්ධීකරණ සහ යෝගිතා සංවර්ධන වැඩ පිළිවෙල යටතේ අස්වැන්නෙන් පසු කටයුතු දියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය සහ විශේෂඥ උපදෙස් ලබා ගෙන ඇත. ඒ සමගම විවිධ කාර්මික නිෂ්පාදන උසස් නිමාවකින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් පුහුණුව සහ මූල්‍ය ආධාර ඒ අංශ වල නියුක්ත වූවන් සඳහා දෙපාර්තමේන්තුව මගින් සැපයීමට කටයුතු යොද ඇත.

කෘෂි ආශ්‍රිත කාර්මික නිමැවුම් උසස් මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය කරන මිල ගණන් තීරණය හා පාලනය මෙන්ම නිමැවුම් වල තත්වය පාලනය පිළිබඳව අමාත්‍යාංශය ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ දී දැඩි අවධානය යොමු කර ඇත. මීට අමතරව නව ආරක කෘෂි කාර්මික නිමැවුම් වශයෙන් පලතුරු සහ එළවලු ටින් කිරීමේ කර්මාන්තය සාපේක්ෂ වශයෙන් ඉතා හොඳ වාසිදයක තත්වයක් ඇති බව පෙනී ගොස් ඇත. ශ්‍රී ලංකාවේ දේශ ගුණික කලාප අනුව විවිධ වර්ගයේ පළතුරු සහ එළවළු බහුලව වැවෙන අතර අවුරුද්ද පුරාම නොකඩවාම විවිධ පළතුරු සහ එළවළු නිෂ්පාදනයන් ඇති බැවින් මෙම නිෂ්පාදන කාර්මික අංශයේ නිෂ්පාදන වලට හැරවීමෙන් නාස්තිය වැළකීමත් විශාල වශයෙන් නියමිත වෙළඳ පලට යැවීමටත් ඇති හැකියාව තේරුම් ගෙන ඇති නිසා මේ සඳහා අවශ්‍ය කල් තබා ගැනීමේ හා ටින් කිරීමේ ක්ෂණික දැනුම හා තාක්ෂණික යන්ත්‍රෝපකරණ සැපයීම මගින් මෙම ද්‍රව්‍ය නිෂ්පාදන වැඩි කිරීම සඳහා කෘෂි කර්ම දෙපාර්තමේන්තුව, ලංකා කාර්මික හා විද්‍යාත්මක ආයතනය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් කටයුතු කරනු ලැබේ. මැද පෙරදිග හා යුරෝපීය වෙළඳ පලට මෙම ද්‍රව්‍ය විශාල ආදායම් ඉපයීමට ඇති හැකියාව පසු ගිය කාලයතුල ලැබූ ආදායම් වර්ධනයෙන් ඉතා පැහැදිලි වේ.

මේ අතර සහල් නිෂ්පාදන ඉදිරියේදී විශාල ලෙස වැඩි වීම වැලැක්වීම සඳහා එක් කන්නයක කුඹුරු වල අතිරේක ආහාර භෝග සහ එළවලු වගා කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කිරීමක් මගින් කෙරෙන නිෂ්පාදන විවිධ අයුරින් සකස් කළ නිෂ්පාදන වශයෙන් වෙළඳ පලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය සුළු පරිමාණ කාර්මික අංශයක් බිහි කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපකරණ ලබා දීමේ වැඩ පිළිවෙලක් කෙරෙහි ද අවධානය යොමු වී තිබේ. මේ අනුව බලන විට කෘෂිකර්මය කාර්මික කිරීම් සඳහා අමාත්‍යාංශය වැඩ කටයුතු රැසක් ඉටු කොට ඇත.